# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන)

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[219 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.00 යි　　　　තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තියේ (1) උප වගන්තියට ඉක්බිතිව ම (1අ) අළුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර අළුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් නීතිය බලපෑම වනුයේ, බුකිකරුවකුගේ සහ ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරයේ දළ එකතුව මත සෑම මාසයක් සම්බන්ධයෙන් ම සියයට පහක අනුප්‍රමාණයට බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම අළුත් (2අ) වගන්තිය ඇතුළත් කරනු ලැබේ. නව වගන්තිය මගින් බුකිකරුවන්ගේ සහ ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලස්වයි.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ "සූදු" යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම "තැනැත්තා" යන වචනය සඳහා අර්ථ නිරූපණයක් ඇතුළත් කරනු ලබයි.

*5 වන වගන්තිය :* මෙම වගන්තියට 2013 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහාම අය කළ හැකි බදු මුදල ඇතුළත් වේ.

# ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන)

එල්. ඩී.—ඕ. 3/2013.

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත**කි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.**

1. මේ පනත 2013 අංක  දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර මේ පනතේ විධිවිධාන සියළු කාර්ය සඳහා 2013 ජනවාරි මස 1 දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

**1988 අංක 40 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. 2005 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය එම වගන්තියේ (1) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උප වගන්තිය ඇතුලත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(1අ) (1) වන උපවගන්තිය යටතේ බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තෙකු විසින්ම එකී බද්ද ගෙවීමට අමතරව එක් එක් මාසය සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ (අ) හෝ වන ඡේදයෙහි ව්‍යාපාරයක් කරගෙන යාමෙන් ලැබෙන දළ එකතුව මත සියයට පහක අනුපාතය අනුව වූ බද්දක් අය කරනු ලැබිය යුතුය :-

එසේ වූවද, මේ උපවගන්තිය යටතේ එකී බද්ද ගෙවීමට යටත් වන තැනැත්තා එම දළ එකතුව මත 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත යටතේ එකතු කල දළ අගය හෝ 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීමට යටත් නොවේ :

එසේම තවදුරටත්, (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) යන ඡේද වල සඳහන් ව්‍යාපාර කරගෙන යන යම් තැනැත්තෙකුගේ දළ එකතුව වර්ෂයකට රුපියල් මිලියන දොළහකට වැඩි නොවන්නේ නම්, හෝ කාර්තුවකට රුපියල් මිලියන තුනකට වැඩි නොවන්නේ නම් එම තැනැත්තා මේ උපවගන්තිය යටතේ ගෙවීමට නියමිත බද්ද ගෙවීමට යටත් නොවිය යුතු ය.

**ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 2අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතුය.

ඔට්ටු ඇල්ලීම හෝ සූදු ව්‍යාපාර ලියාපදිංචි කිරීම

2අ. (1) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වන පරිදි කරගෙන යනු ලබන ව්‍යාපාරය හෝ සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන නියැලී සිටින සෑම තැනැත්තෙක් ම 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව අවස්ථාවෝචිත පරිදි මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට මාස පහක කාලසීමාවක් ඇතුළත හෝ ව්‍යාපාරය ආරම්භ කිරීමේ දින සිට එක් මසක් ඇතුළත දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි විය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තෙකු ම වරදක් සිදු කරන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබුවහොත් රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් වන්නේය.''.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**4.** 2003 අංක 23 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 7 වන වගන්තියේ ''සූදු'' යන වචනයේ අර්ථනිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථනිරූපනය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''තැනැත්තා'' යන්නට යම් සමාගමක්, සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවූ පුද්ගල මණ්ඩලයක් හෝ යම් හවුල් ව්‍යාපාරයක් ඇතුළත් වේ;''.

**වලංගුභාවය සහ හානිපූරණය.**

**5.** 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීමෙන් අවසන් වන කාල සීමාව තුළදී කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ 2 වන වගන්තියේ (1අ) උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකුගෙන් අයකර ගනු ලැබූ හෝ එකතුකරගනු ලැබූ සියළු කාර්යයන් සඳහා වලංගු ලෙස සිදු කර

ඇති බව හෝ කරනු ලබන ලෙසත් සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමට එරෙහිව අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබිය යුතුය.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය මෙයින් ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

"**උපලේඛනය** **(2 වන වගන්තිය)**

I වන කොටස

බුකීකරුවෙකු ලෙස ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින් මේ I තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහාම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතුය.

| ***I වන තීරුව*** ***වර්ෂය*** | ***II වන තීරුව*** ***බදු මුදල*** |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා. | රුපියල් එක්ලක්ෂයයි. |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා. | රුපියල් මිලියන එකයි. |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා - | |
| (i) ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කරන අවස්ථාවක. | රුපියල් තිස්දහසක්. |
| (ii) ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකරන අවස්ථාවක. | රුපියල් දස දහසක්. |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා සූදු ඇල්ලීමේ ව්‍යාපාරය - | |
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට | රුපියල් මිලියන එකක්. |

| | |
|---|---|
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතාකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් දෙලක්ෂ පනස් දහසක්. |
| (iii) සජීවි රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් විසි දහසක්. |
| 5. 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා සූදු ඇල්ලීමේ ව්‍යාපාරය :- | |
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට, | රුපියල් මිලියන එකක් ; |
| (ii) සජීවි රූපවාහිනී පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් තුන් ලක්ෂයක්; |
| (iii) සජීවි රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් පනස් දහසක්; |

## II වන කොටස

සූදු ව්‍යාපාරයක් කරගෙන යනු ලබන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහාම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි වන II තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතුය.

| ***I වන තීරුව*** ***වර්ෂය*** | ***II වන තීරුව*** ***බදු මුදල් ප්‍රමාණය*** |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා. | රුපියල් මිලියන එකයි ; |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා. | රුපියල් මිලියන විසි පහක් ; |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා - | |
| (i) (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන දොළහක් ; |

| | |
|---|---|
| (ii) (රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් පන්ලක්ෂයක්. |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා රූජිනෝ ක්‍රීඩාව, ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන පනහයි. |
| 5. 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා රූජිනෝ ක්‍රීඩාව, ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන සියයක්.” |

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.